# 7 ශ්‍රේණිය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

කියවීම් ද්‍රව්‍ය




## ඒකකය 7

### තොරතුරු හා සන්නිවේදනය සඳහා අන්තර්ජාලය භාවිතය




## අන්තර්ජාලය හඳුනා ගනිමු

ජී. එම්. දිනුකා නිලුක්ෂි මෙනවිය

මාර/ පිටබැද්දර ද්විතියික පාසල - මාතර

# අන්තර්ජාලයේ ඉතිහාසය.

අන්තර්ජාලය විකාශනය ආරම්භ වන්නේ 1969 දී ARPANET (Advanced Research Projects Agency Network) ව්‍යාපෘතියත් සමගිනි.
මෙහිදී,

- ඇමරිකානු රාජ්‍ය ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය
- පරිගණක හරහා විශ්ව විද්‍යාල එකිනෙක සම්බන්ධ කිරීම

යන කරුණු මූලික අරමුණු කරගෙන අන්තර්ජාලය භාවිතය ආරම්භ විය. මෙසේ ඇරඹි අන්තර්ජාලය වර්ෂ 1990 කාලයෙන් පසුව අනෙකුත් ජාල සමගද එක්ව,

- පරිගණක
- ජංගම දුරකතන
- GPS ඒකක
- වීඩියෝ ක්‍රීඩා පාලන පුවරු

වැනි මිලියන ගණන් වූ පරිගණක උපාංග එකිනෙක සම්බන්ධ කරමින් මුළු මහත් ලෝකය පුරාම ක්‍රමයෙන් ප්‍රචලිත විය.

# පරිගණක ජාලයක් යනු...



පරිගණක දෙකක් හෝ කිහිපයක් එකිනෙකට සම්බන්ධ වී සැදුණු ජාලයකි.
මේ මගින් සම්බන්ධිත පරිගණක අතරේ තොරතුරු හුවමාරු කර ගැනීමට ඉඩ ලබා දෙයි.

# අන්තර්ජාලය යනු...




එකිනෙක සම්බන්ධ පරිගණක ජාල විශාල ප්‍රමාණයකින් සැදුණු අතිවිශාල සන්නිවේදන ජාලයකි.
අද වන විට මිනිසාගේ දෛනික කටයුතු සඳහා අන්තර්ජාලය අත්‍යාවශ්‍ය අංගයක් වී ඇත.
උදාහරණ :-

- අධ්‍යාපනික කටයුතු
- රැකියා කටයුතු
- මාර්ගගත සාප්පු
- සිතියම් නිරීක්ෂණය
- බිල්පත් ගෙවීම
- විද්‍යුත් තැපැල් (email) යැවීම
- භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීම
- වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම
- යහළුවන්, නෑදෑ හිතවතුන් සමග තොරතුරු හුවමාරු කර ගැනීම
- පින්තූර බැලීම, ගීත ඇසීම, වීඩියෝ නැරඹීම හා ඒවා බාගත කිරීම
- පරිගණක ක්‍රීඩා කිරීම

# අන්තර්ජාලයට සම්බන්ධ වීමට අවශ්‍ය වන්නේ මොනවාද?




(1) පරිගණකයක්
(2) අන්තර්ජාල සේවා සපයන්නෙක් (Internet Service Provider – ISP)
(3) අන්තර්ජාල සම්බන්ධතාවය (phone line, cable, DSL, wireless)
(4) මොඩමයක් (Modem)
(5) අන්තර්ජාල මෘදුකාංග

# WWW

- WWW – World Wide Web (ලෝක විසිරි වියමන)
- නිර්මාතෘ : සර් ටිම් බර්නර්ස් ලී (1991)

අන්තර්ජාලයෙන් සැපයෙන ප්‍රධාන සේවාවක් වන www ලොව පුරා ඇති වෙබ් සේවාදායක පරිගණක වල ගබඩා කරන ලද මිලියන ගණන් වූ වෙබ් අඩවි වල විශාල එකතුවකි. මෙම වෙබ් අඩවි වෙබ් පිටු එකතු වීමෙන් සෑදී ඇත.



වෙබ් පිටුවක් තුළ :

- ලිඛිත සටහන් (text)
- පින්තූර (images)
- හඬ (audio)
- වීඩියෝ (video)
- අධිසන්ධාන (hyperlinks)

වැනි බහුමාධ්‍ය අන්තර්ගත කර ඇත. ලොව ඕනෑම තැනක සිට පරිගණකයක්/ ජංගම දුරකතනයක් භාවිතා කිරීමෙන් මෙම අන්තර්ගත සොයා ගැනීමට www ඉඩ ප්‍රස්ථාව ලබා දෙයි. අන්තර්ජාලයට පිවිස මෙම වෙබ් අන්තර්ගත පරිශීලනයට වෙබ් අතරික්සු (web browsers) නම් වූ යෙදුම් මෘදුකාංග උපකාරී වේ.

උදාහරණ :-

Google Chrome Mozilla Firefox Internet Explorer Opera Safari

# URL

❖ URL – Uniform Resource Locator (ඒකාකාර සම්පත් නිශ්චායකය)

වෙබ් ලිපින ලෙසද හඳුන්වන මෙම url, ලෝක විසිරි වියමන තුළ ඇති විවිධ වෙබ් අඩවි, වෙබ් පිටු හා ඒවායේ අන්තර්ගත සම්පත් එකින් එක සුවිශේෂී ලෙස හඳුනා ගැනීමට උපකාරී වේ. මෙම වෙබ් ලිපින වෙබ් අතරික්සුවේ ලිපින තීරුවෙහි (address bar) දර්ශනය වේ.




උදාහරණ :-

- අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් අඩවි ලිපිනය - https://www.moe.gov.lk
- e-තක්සලාව වෙබ් අඩවි ලිපිනය - https://www.e-thaksalawa.moe.gov.lk
- විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවි ලිපිනය - https://www.doenets.lk




වෙබ් ලිපිනය https ලෙස ආරම්භ වීම **

සලකුණ දිස් වීම **

** ඉහත ක්‍රම මගින් අප පිවිසෙන වෙබ් අඩවි විශ්වාසනීය වෙබ් අඩවිදැයි හඳුනා ගත හැකිය.

# වීඩියෝ සම්මන්ත්‍රණ.



භූගෝලීය වශයෙන් දුරස්ථ ස්ථාන වල සිටින පුද්ගලයින් වීඩියෝ තාක්ෂණය යොදා ගෙන අන්තර්ජාලය ඔස්සේ සාකච්ඡා පැවැත්වීම වීඩියෝ සම්මන්ත්‍රණ ලෙස හඳුන්වයි.

## වීඩියෝ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට අවශ්‍ය වන්නේ...




(1) පරිගණකය
(2) වෙබ් කැමරාව
(3) මයික්‍රොෆෝනය
(4) අන්තර්ජාල සම්බන්ධතාවය
(5) මෘදුකාංග

## වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්විය හැකි මෘදුකාංග...

Zoom Meet Skype Teams Webex GoToMeeting

## වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීමේ වාසි හා අවාසි.

**වාසි**

- සම්මන්ත්‍රණය පැවැත්වෙන ස්ථානයට යාමට සිදු නොවීම.
- ගමන් ගාස්තු ඉතිරි වීම.
- ගමන් කාලය ඉතිරි වීම.
- ඉක්මනින් සම්මන්ත්‍රණය පැවැත්වීමට සූදානම් කළ හැකි වීම.
- ඕනෑම රටක/ප්‍රදේශයක සිට පුද්ගලයින් සම්බන්ධ කර ගැනීමට හැකි වීම.
- එකවර වැඩි පිරිසක් සහභාගී කරවා ගැනීමට හැකි වීම.
- බහුමාධ්‍ය සම්පත් පහසුවෙන් බෙදා දීමට හැකි වීම.
- සම්මන්ත්‍රණය පටිගත කිරීමට හා බෙදා හැරීමට හැකි වීම.

**අවාසි**

- තාක්ෂණික උපාංග හා අන්තර්ජාල පහසුකම් අත්‍යාවශ්‍ය වීම.
- තාක්ෂණික දැනුම අවශ්‍ය වීම.
- අඩු වේග අන්තර්ජාල සම්බන්ධතා වලදී සන්නිවේදනය අවහිර වීම.
- තාක්ෂණික දෝෂ ඇති වීමෙන් සම්මන්ත්‍රණයට බාධා පැමිණීම.
- ඇතැම් පුද්ගලයින් සක්‍රිය ලෙස සහභාගී නොවීම.
- අවසර නොලත් පුද්ගලයින් සහභාගී වීම.

*****